**ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආරක්ෂක විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආරක්ෂක විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වා ගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයන් සඳහා වාර්ෂික ක්ෂය ප්‍රතිපාදන සිදු කර නොතිබුණු පොල් පෙරසැරි ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල,ජීව වායු ඒකකය,මාර්ග පද්ධතිය සහ වැට ආවරණය යන වත්කම් සම්බන්ධයෙන් එම වර්ෂයන්වලට අදාල රු.මිලියන 4.48 ක්වූ ක්ෂය ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ ගැලපීම් කර තිබුණි. | ප්‍රමාණාත්මක වටිනාකමක් නොවන බැවින් මෙම වර්ෂයේ ලාභයට ගලපා ඇත. | ඉකුත් වර්ෂවලට අදාල ගැලපීමක් සේ සලකා ගිණුම්කරණ ගැලපීම සිදු කිරීම යෝග්‍ය වේ. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණය හිමි ශේෂයේ ඇතුලත් වූ හඳුනා නොගත් තැන්පතු වටිනාකම්වල එකතුව රු.මිලියන 45.42 ක් විය. | මෙම ශේෂයන් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වටිනාකම නොපමාව නිරවුල් කිරීම මගින් ඉදිරි වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ගුණාත්මකභාවය තහවුරු කල හැකිවේ. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණය හිමියන් යටතේ ස්වයං මූල්‍ය අරමුදලේ රු.මිලියන 1.89 ක සසඳා නොතිබුණු ශේෂයක් ඇතුලත් විය. | මෙම ශේෂයන් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වටිනාකම හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් හා ගෙවිය යුතු වියදම් ලෙස දක්වා තිබුණු එකතුව රු.මිලියන 3,928.36 ක් වූ ගෙවිය යුතු ශේෂ අතරින් එකතුව රු.මිලියන 81.50 ක් වූ ශේෂ වර්ෂ 02 කට අධික කාලයක් නිරවුල් නොකර පැවතුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම හෝ ආදායමට ගැනීම තුලින් මූල්‍ය ප්‍රකාශන වඩා පැහැදිලිව ඉදිරිපත් කළ හැකිවේ. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 237(ආ) ප්‍රකාරව, මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට පෙර අදාළ භාණ්ඩ සියල්ල ලැබී ඇති බවට ද, අදාළ තොග ලේඛනයන්හි එකී භාණ්ඩ | විශ්වවිද්‍යාලයේ හදිසි අවශ්‍යතා වෙනුවෙන් මෙවැනි අත්තිකාරම් ලබාදුන් බවත්,ඉදිරියේදී එවැනි අත්තිකාරම් ගෙවීමේදී මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව කටයුතු | මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 237(ආ) ප්‍රකාරව කටයුතු කල යුතුය. භාණ්ඩ ලැබීමෙන් පසු ගෙවීම් කරන බවට අදාළ |

| | | |
|---|---|---|
| ඇතුළත් කර ඇති බවටද සහතික කළ යුතු වුවද, ඊට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 125 කදී භාණ්ඩ මිලදී ගැනීමට පෙර රු.මිලියන 51.04 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. ඉහත පරිදි 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මිලදී ගැනීම් වෙනුවෙන් ගෙවා තිබුණු අත්තිකාරම් රු. මිලියන 3.08 ක් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. | කරනු ලබන බවත් දක්වන ලදී. | වන කොන්දේසි, සැපයුම් ගිවිසුමවල ඇතුළත් කිරීමෙන් මේ සම්බන්ධයෙන් ඇතිවන ගැටළු අවම කර ගැනීමට කටයුතු කල හැකිය. |
| (ආ) ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් විදේශීය පුරවැසිභාවය සහිත ශිෂ්‍යයින් සඳහා සපයනු ලබන ආහාර හා නවාතැන් පහසුකම් වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.මිලියන 3.08 ක මුදලක් වර්ෂ 03 ක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. | අයකර ගැනීම සිදු කරමින් පවතින බව දක්වා තිබුණි. | මෙම ලැබිය යුතු ණය ශේෂයන් නිවැරදිව හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කිරීම මගින් ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල ගුණාත්මකභාවය තහවුරු කල හැකිවේ. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **(i)** 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත<br>(ii) 1988 අංක 27 දරන සංශෝධිත පනත<br>(iii) 2007 අංක 50 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත | ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පිහිටුවීමේ පනතට අනුව සහ එහි දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන් අනුව ආයතනයේ උපාධි පාඨමාලා ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් පමණක් සීමා විය යුතුය. | පනත සංශෝධනය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන උපාධි සහතිකවල නීතිමය පිළිගැනීම තහවුරු කල හැකිවන පරිදි අදාල පාර්ලිමේන්තු පනත් සංශෝධනය කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | විශ්ව විද්‍යාලයේ පසුකාලීනව ඇති වූ වෙනස්කම් අනුව වෙනත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන්ද 2011 වර්ෂයේ සිට උපාධි පිරිනමන නමුත් උක්ත පාර්ලිමේන්තු පනත් සංශෝධනයට ලක් කර නොතිබුණි. | | |
| (ආ) | 1988 අංක 27 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත | උක්ත පනත අනුව වෛද්‍ය පීඨය සඳහා මුදල් පදනම මත දේශීය ශිෂ්‍යයින් බඳවා ගැනීමට හෝ උපාධි ප්‍රදානය කිරීමට අවසරයක් නොමැත. කෙසේ වෙතත් වෛද්‍ය පීඨය විසින් විදේශීය පුරවැසිභාවය මත බඳවා ගෙන තිබුණු ශිෂ්‍යයින් 64 දෙනෙකු ද්විත්ව පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් වූ බව නිරීක්ෂණය විය. | විදේශීය සුදුසුකම් මත බඳවා ගත් සිසුන් බව දක්වා ඇත. | මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ලබා ගැනීමෙන් අනතුරුව වෛද්‍ය පීඨය සඳහා බඳවා ගැනීම් ක්‍රමවේදය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විශ්වවිද්‍යාලීය මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 2,101.16 ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 555.55 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 2,656.71 ක පිරිහීමක් විය. සමාලෝචිත වර්ෂයෙහි විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා ලබා ගෙන තිබුණු ණය මුදල සඳහා වූ පොළිය රු.මිලියන 3,734.72 කින් ඉහලයාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු ආදායම වැඩිවීමට මූලික වශයෙන් හේතු වී තිබුණේ රජයේ පුනරාවර්තන ලැබීම් වූ අතර එය රු.මිලියන 3,615.15 ක් විය. ඉන් රු.මිලියන 2,294.03 ක්ම විශ්වවිද්‍යාලීය රෝහල සඳහා ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම් වර්ධනය සඳහා බලපා තිබුණු අනෙක් කරුණ වූයේ පාඨමාලා ගාස්තු ආදායම රු.මිලියන 1,060.15 ක් සහ අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරගනු ලැබූ දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනය මගින් ලැබුණු රු. මිලියන 258.69 ක ආදායම විය.

## 2.3 අනුපාත විශ්ලේෂණය

### (අ) යෙදූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය

2017 වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය සියයට 5.06 ක් වූ අතර ඊට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම අනුපාතය සියයට 21.07 ක පිරිහීමක් විය.

### (ආ) ජංගම අනුපාතය

2018 වර්ෂයේදී ජංගම වත්කම්වලට ජංගම වගකීම් අනුපාතය සියයට 2.08:1 ක අගයක් විය. තවදුරටත් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන ලබා ගැනීම මගින් විශ්වවිද්‍යාලයෙහි කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනීමට සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

### (ඇ) තෝලන අනුපාතය

2017 වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනයට ණය ප්‍රාග්ධනයේ අනුපාතය 1:2.84 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 1:3.51 ක් වී තිබුණි. ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් 2013 වර්ෂයේදී ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ ඇපකරයක් මත විදේශීය මුදලින් ඇ.එ.ජ ඩොලර් මිලියන 177.33 ක් සහ රු.මිලියන 3,165.12 ක් දේශීය මුදලින් වූ ණයක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගෙන තිබුණි.උක්ත ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 17 වන දින නව ගිවිසුමකට එළඹ තිබුණු අතර ඒ අනුව මුල් ණය මුදලින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 82.33 ක් 2018 සැප්තැම්බර් 17 දින ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර තිබුණු අතර ඉතිරි මුදල වූ ඇ.එ.ජ. ඩොලර් මිලියන 95 වාරික 11 කින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමට එකඟ වී තිබුණි. තවද ණය මුදල මත ගෙවිය යුතුව තිබුණු රු. මිලියන 627.09 ක පොළී මුදලක් සහ විනිමය හුවමාරුවීමේදී බැංකුව දරාගැනීමට සිදු වී තිබුණු රු.මිලියන 617.47 ක විනිමය අවාසියක් ණය මුදල සඳහා ණය ප්‍රාග්ධනය ලෙස එකතු කර තිබුණි. කෙසේ වෙතත් උක්ත ණය මුදලේ පොළී මුදල් සහ ණය වාරික භාණ්ඩාගාරය විසින් 2023 වර්ෂයේ සිට ගෙවීමටත්,දේශීය මුදලින් වූ රු. මිලියන 3,165.12 ක ණය මුදල මත ගෙවිය යුතුව තිබුණු රු.මිලියන 90.83 ක් වූ පොළී මුදල 2023 වර්ෂයේ සිට වසර 9 කින් ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු බවට එකඟ වී තිබීම තෝලන අනුපාතය ඉහලයාමට බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2017 මැයි 21 දින ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර තිබුණු ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහලේ මෙහෙයුම් කටයුතු 2017 දෙසැම්බර් මාසයේ සිට ආරම්භ කර තිබුණි.කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2018 අගෝස්තු 17 දින ශික්ෂණ රෝහල සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර ඒ සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ පටිපාටි 2018 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර අනුමත කර නොතිබුණි. මේ හේතුවෙන් ශික්ෂණ රෝහලේ මෙහෙයුම් කටයුතු උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ. | කාර්යය පටිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | ශික්ෂණ රෝහල මගින් සපුරාලීමට බලාපොරොත්තු වන ඉලක්ක හා සේවාවන් සම්බන්ධයෙන් අදාල පාර්ශ්වයන් දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම අවශ්‍ය වේ.ඒ අනුව මේ සම්බන්ධයෙන් රජය විසින් සිදු කරන ලද ආයෝජනයට ප්‍රතිලාභයක් ලැබෙන පරිදි කාර්යය මණ්ඩලය කඩිනමින් බඳවා ගැනීමෙන් ශික්ෂණ රෝහල උපරිම ධාරිතාවයෙන් උපයෝජනය කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. |
| - ශික්ෂණ රෝහල සඳහා අවශ්‍ය කරන වෛද්‍ය උපකරණ එක් එක් අදියරයන්හි සපයා සවිකිරීම සඳහා ඇ.එ.ජ.ඩොලර් 39,629,000 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු හේතුවෙන් එක් එක් අදියර යටතේ මිලදී ගැනීමට | රෝහල ඉදිකිරීම ප්‍රමාදයත්, මානව සම්පත්වල හිඟතාවයත් නිසා බොහෝ වෛද්‍ය උපකරන අපේක්ෂිත අදියරයන් යටතේ මිලදී ගැනීමෙන් වැලකී සිටින ලදී. අවශ්‍යතාවයන් අනුව ඉදිරියේදී ඒවා මිලදී ගැනීමටත් කටයුතු කරනු ලැබේ. | රෝහල පූර්ණ ක්‍රියාකාරී තත්ත්වයකට ගෙන ඒමට නොපමාව කටයුතු කල යුතුය. |

සැලසුම් කර තිබුණු වෛද්‍ය උපකරණ අපේක්ෂිත අවශ්‍යතාවයන්ට වඩා අඩුවෙන් සපයා ගෙන තිබුණි.

- ශික්ෂණ රෝහල තුළ ක්‍රියාත්මක විය යුතු සේවාවන් ඉටු කිරීම සඳහා හදිසි අනතුරු ඒකකය, සාමාන්‍ය බාහිර රෝගී සේවාව, විශේෂඥ වෛද්‍ය සේවා, විශේෂ වෛද්‍ය සේවා, ශල්‍යාගාර සේවා, දැඩි සත්කාර ඒකකය ඇතුලත්ව ඒකක 13 ක කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කර නොතිබුණි.

- තවද 2018 දෙසැම්බර් 31 දිනට ශික්ෂණ රෝහලේ ස්ථාපිත කර තිබුණු රෝගී ඇඳන් ප්‍රමාණය 433 ක් වු අතර 2018 මාර්තු සිට 2018 දෙසැම්බර් දක්වා කාලය තුළ නේවාසික රෝගීන් 2,012 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිකාර ලබා දී තිබුණි. ඒ අනුව සාමාන්‍ය ඇඳන් උපයෝජන අනුපාතය එක් ඇඳක් සඳහා නේවාසික රෝගීන් 04 ක් පමණක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු බාහිර සායන 16 ක් මගින් පහසුකම් සැපයිය හැකි උපරිම රෝගීන් ප්‍රමාණය 95,820 ක් වුවද ප්‍රතිකාර ලබාදී තිබුණේ රෝගීන් 25,735ක් සඳහා පමණක් විය.

අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබා ගැනීමේදී ඇතිවු ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනට සම්පූර්ණ වශයෙන් නිමා නොවීම සහ කාර්යය මණ්ඩලයේ පවත්නා අඩුපාඩු හේතුකොට ගෙන පූර්ණ ලෙස රෝහල ක්‍රියාත්මක නොවන බව දක්වා ඇත.

| | | |
|---|---|---|
| - ශික්ෂණ රෝහලේ අනුමත වෛද්‍ය කාර්ය මණ්ඩලය සහ පරිපාලන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 1,380 ක් සහ 516 ක් වුවද 2018 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් පදනම සහ අනුයුක්තගත හමුදා නිලධාරීන් ඇතුලත්ව සේවා නියුක්ත වෛද්‍ය කාර්ය මණ්ඩලය සහ පරිපාලන කාර්ය මණ්ඩලය නිලධාරීන් 437 ක් සහ 284කින් සමන්විත විය. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සිටි කාර්ය මණ්ඩලයෙන් නිලධාරීන් 85 දෙනෙකු 2018 සහ 2019 වර්ෂයන් තුළදී සේවයෙන් ඉවත් වී ගොස් තිබුණි. | රෝහල සඳහා අනුමත කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරවාලීමෙන් අනතුරුව කාර්යය මණ්ඩලය අවශ්‍යතාවය මත බඳවා ගැනීමේ කටයුතු කරන බව දක්වා ඇත. | රෝහල් කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) ආරක්ෂක විශ්ව විද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපයේ ක්‍රියාත්මකව පැවති පීඨයන් දෙකෙහි පාඨමාලාවන් 4ක් මගින් ශිෂ්‍යයින් සඳහා සමාලෝචිත වර්ෂය තුල පවත්වනු ලැබීමට සැලසුම් කර තිබුණු දේශන පැය ප්‍රමාණය 3,204 ක් වූ නමුත් සත්‍ය වශයෙන් පවත්වා තිබුණු දේශන පැය ප්‍රමාණය 2,147.50 ක් විය. | අධ්‍යයන පැයවලින් පසු පන්ති,පන්තිකාමර පැවරුම්,ප්‍රායෝගික සාකච්ඡා පැවැත්වීම, යනාදිය මගින් විෂයමාලා අන්තර්ගතයන් ආවරණය කර ඇත | සැලසුම් කල පරිදි දේශන පැවැත්වීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) දක්ෂිණ මණ්ඩපය සඳහා ස්ථිර පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකර නොතිබීම හේතුවෙන් පුස්තකාලය වර්ග අඩි 1152 ක පමණ විශාලත්වයෙන් යුත් | පුස්තකාලය සඳහා ප්‍රධාන ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2020 දී අරමුදල් වෙන් කිරීමට අපේක්ෂිත අතර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශිත පොත් ප්‍රමුඛතා ලැයිස්තු පවත්වා |

| | | | |
|---|---|---|---|
| | සෙවිලි තහඩුවලින් නිමකර තිබුණු පෙරනිමි ගොඩනැගිල්ලක පවත්වා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 460 ක් දක්ෂිණ මණ්ඩපය තුළ අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන නමුත් පුස්තකාලයෙහි පවතින පොත් ප්‍රමාණය 1,800 ක් පමණක් විය. | කර ඇති නමුත් මේ වන තෙක් මිලදී නොගත් පොත් මිලදී ගැනීමට කටයුතු කරමින් පවති. | ගැනීමටත්,ප්‍රමාණවත් පුස්තකාල ගොඩනැගිලි පහසුකම් පවත්වා ගැනීමටත් ක්‍රියා කිරීම මගින් උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමට ක්‍රියාකල යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1,393 දෙනෙකු වූ අතර ඊට ආරක්ෂක අංශවලට අයත් කැඩෙට් නිලධාරීන් 382 දෙනෙකුද, සමාලෝචිත වර්ෂය තුල දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනයෙන් අනුයුක්ත කරන ලද 819 දෙනෙකුද ඇතුලත් විය.2018 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය පීඨයේ කණ්ඩායම් 06 ක විදේශීය සුදුසුකම් සහිත ශිෂ්‍යයින් 192 දෙනෙකු අධ්‍යයන කටයුතු වල නිරත වන නමුත් විදේශීය ශිෂ්‍යයින් බඳවා ගැනීම ක්‍රමයෙන් පිරිහෙමින් පැවති අතර සමාලෝචිත වර්ෂයේදී බඳවාගෙන තිබුණේ ශිෂ්‍යයින් 25ක් පමණි. | රුවන්ඩා සිසුන්ගේ පැමිණීම අඩු වීම සහ සීමාවාසික වෛද්‍ය පුහුණුව ලබා දීම සඳහා මේ වනතෙක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිසියාකාර තීරණයක් ලබාදී නොමැතිවීම විදේශීය සුදුසුකම් මත බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය අඩුවීමට හේතුවී ඇති බව දක්වා ඇත. | විදේශීය පුරවැසිභාවය සහිත සිසුන් ආකර්ශණය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල ශික්ෂණ රෝහල සඳහා දරා තිබුණු විදුලි වියදම රු.මිලියන 200.95 ක් විය. සමස්ථ රෝහල් පද්ධතිය සඳහාම මධ්‍යගතව වායු සමීකරණ සේවාවක් ක්‍රියාත්මක වන අතර, සමාලෝචිත වර්ෂයේ දී රෝහල තුළ ක්‍රියාත්මක නොවන අංශ 24 ක් පැවතීම හේතුවෙන් ඉහල විදුලි වියදමක් දැරීමට සිදු වී තිබුණි. | විදුලි වියදම අඩු කිරීම සඳහා ක්‍රියා මාර්ග ගෙන ඇති අතර ක්‍රියාකාරී නොවන අංශවල වායු සමීකරණ සේවාව නතර කර ඇත. | ආයතනයේ අභ්‍යන්තර පිරිවැය පාලන කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම මගින් මූල්‍ය තත්වය ඉහල නැංවීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. |
| (ආ) ශික්ෂණ රෝහල සඳහා සමාලෝචිත වර්ෂයේදී දුරකථන හා අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් දරා තිබුණු වියදම රු මිලියන 8. 14 ක ඉහල අගයක් ගෙන තිබුණි. අන්තර්ජාල පහසුකම් සඳහා ලබා ගෙන තිබුණු දත්ත පැකේජය යටතේ මාසිකව ටෙරා බයිට් 259 සඳහා රු.මිලියන 0.66 ක ගාස්තුවක් ගෙවා තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 06 ක කාල සීමාව තුළ සාමාන්‍යය මාසික දත්ත භාවිතය ටෙරා බයිට් 6 ක් පමණක් විය. | අන්තර්ජාල පහසුකම් කල්බදු දත්ත මාර්ගයෙන් ලබා ගෙන ඇති බවත් දැනට පවතින දත්ත පැකේජය අඩු ධාරිතාවයකට ගෙන ඒමට සාකච්ඡා කර ඇත. | |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාලයේ එක් අභ්‍යන්තර ආචාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ අධීක්ෂණයට යටත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ. | වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාවන් පදනම් කර ගනිමින් පැවතිය යුතු ගුරු ශිෂ්‍ය අනුපාතයට ගැලපෙන පරිදි කාර්යය මණ්ඩල අවශ්‍යතාවයට ආරක්ෂක අමාත්‍යංශයේ නිර්දේශය සහිතව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පොදුවේ පිළිගත් නිර්නායක අනුව ගුරු සිසු අනුපාතය පවත්වා |

| | | |
|---|---|---|
| පීඨයේ නම — එක් ආචාර්ය වරයෙකු යටතේ වූ ශිෂ්‍ය සංඛ්‍යාව<br>වෛද්‍ය 24<br>සම සෞඛ්‍යය 12<br>නීති 57<br>ඉංජිනේරු 24<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්නායක අනුව, වෛද්‍ය පීඨයන් සඳහා එක් ආචාර්යවරයෙකු විසින් ශිෂ්‍යයින් 07 දෙනෙකුද,සම සෞඛ්‍ය ශිෂ්‍යයින් 10 දෙනෙකුද උපරිම වශයෙන් අධීක්ෂණය කළ හැකි අතර නීති හා ඉංජිනේරු පීඨවල එක් ආචාර්යයවරයෙකු විසින් පිළිවෙලින් ශිෂ්‍යයින් 18 ක් හා ශිෂ්‍යයින් 10ක් පමණක් උපරිම වශයෙන් අධීක්ෂණය කළ හැකි වේ. | ගැනීමට කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණි. | ගෙනයාමට කටයුතු කිරීම මගින් උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය පවත්වා ගෙනයාමට කටයුතු කළ යුතුය. |

### 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්ව විද්‍යාලයට අනුබද්ධිත දක්ෂිණ මණ්ඩපයේ ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂය අවසානය වන විට නිම කිරීමට යෝජිතව පැවති නමුත් ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීමෙන් ඉදිකිරීම් කටයුතු මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය විය. | ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන ලැබීමේ මන්දගාමී තත්වයක් පැවතීම හේතුවෙන් ප්‍රමුඛතාවයන් අනුව අවස්ථානුකූලව සිදු කරනු ලබන බවත් දක්වා තිබුණි. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කිරීම මගින් පිරිවැය අවම කර ගැනීමටත් අධ්‍යයන කටයුතු විධිමත් පහසුකම් යටතේ සිදු කිරීමටත් කටයුතු කල යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කැඩෙට් නිලධාරී නිවස්නයේ සලාක ද්‍රව්‍ය අවශ්‍යතා වෙනුවෙන් 2018 වර්ෂය තුළ රු.මිලියන 53.54 ක සලාක ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු නමුත් ඒ සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමට මිල ගණන් කැඳවීමක් සිදුකර නොතිබුණි. | මිලදී ගැනීමට මණ්ඩලයක් පත්කර ගැනීම සඳහා ලිඛිතව ඉල්ලුම් කර ඇති අතර අයවීමට තිබුණු සලාක මුදල් මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | විධිමත් පරිදි මිල ගණන් කැඳවා සලාක ද්‍රව්‍ය මිලදී ගත යුතු අතර අයවිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු වීම. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පොදු කාරක සභාව නියෝග කර තිබුණු පරිදි විශ්වවිද්‍යාලය සඳහා අනුමත කාර්යය මණ්ඩලයට අමතරව සිටින ත්‍රිවිධ හමුදාවන්ගෙන් අනුයුක්ත වූ 1,327 ක් වූ නිලධාරී කාර්යය මණ්ඩලය සඳහා විධිමත් අනුමැතියක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ලබා ගත් බව නිරීක්ෂණය නොවීය. | විශ්ව විද්‍යාලය සඳහා සකසන ලද නව තනතුරු ලේඛණය අනුමත කරවා ගැනිමට කටයුතු කරමින් සිටින බව දක්වා ඇත. | රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පොදු කාරක සභාවේ නිර්දේශයන් පරිදි කටයුතු කල යුතු වේ. |
| (ආ) ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති(අධ්‍යයන), මූල්‍යාධිකාරී සහ ලේඛකාධිකාරී සහ පුස්තකාලාධිපති තනතුරු 2018 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ දෙකකට වැඩි කාලයක් පුරප්පාඩු වී තිබුණි. එම තනතුරු සඳහා වැඩබලන නිලධාරීන් 04 දෙනෙක් සේවයේ යොදවා තිබුණි. | බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | විශ්වවිද්‍යාලයේ කටයුතු වෙනුවෙන් නොපමාව එම තනතුරු සඳහා නිත්‍ය නිලධාරීන් බඳවා |

| | | |
|---|---|---|
| (ඇ) ආරක්ෂක විශ්ව විද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපයේ තනතුරු 741ක් පුරප්පාඩුව පැවතුණු අතර,වෙනත් තනතුරු 39 ක් අතිරික්තව පැවතුණි.2018 දෙසැම්බර් 31 දිනට දක්ෂිණ මණ්ඩපය තුල මහාචාර්ය තනතුරු 07 ක් ජ්‍යොෂ්ඨ කථිකාචාර්ය තනතුරු 25 ක් හා උපදේශක තනතුරු 07ක් පුරප්පාඩුව පැවතුණි. | බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. | ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2019 අප්‍රේල් 18 දින වන අතර එම මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ 2019 මැයි 07 දිනදීය. | ඉදිරියේදී නිවැරදි දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. | නියමිත දිනට හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කල යුතු වේ. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශික්ෂණ රෝහල් ව්‍යාපෘතිය පිළිබඳව ඉදිරිපත් කර තිබුණු ශක්‍යතා වාර්තාව අනුව රෝහල් මෙහෙයුම් කටයුතු ආරම්භ වූ පසු ප්‍රතිකාර සේවා සැපයීම තුළින් ආදායම් ඉපයීම සැලසුම් කර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් රෝහල සඳහා ව්‍යාපාර සැලසුම පිළියෙල කර නොතිබුණි. | 2018 වර්ෂය තුළදී ආදායම් උපයා ගැනීමේ සැලැස්ම සකස් කර 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ. | ආදායම් ඉපයීම පිළිබඳව නිසි ව්‍යාපාර සැලසුම් සකස් කිරීම මගින් ආයතන කටයුතු තිරසාර පදනමක් මත සිදු කිරීමට පියවර ගත යුතුය. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර සිටි විගණන කාර්යය මණ්ඩලය 4 ක් පමණක් වූ අතර, එම ප්‍රමාණය පසුකාලීනව පුළුල් වූ විශ්ව විද්‍යාලයේ කාර්යයභාරය ආවරණය කිරීමට තරම් ප්‍රමාණවත් නොවූ බව නිරීක්ෂණය විය. | අමතර කාර්ය මණ්ඩලයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇති බව දක්වා තිබුණි. | ප්‍රමාණවත් විගණන කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීම මගින් අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත් කළ යුතුය. |

## 4.4 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී වියදම් ඒකක 07 ක ඇස්තමේන්තු ගත වියදම සහ සත්‍ය වියදම අතර සියයට 36 සිට සියයට 4,264 දක්වා පරාසයක පැවති විචලනයන් වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි. | විචලායයන් අවම කර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | අයවැය ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සැලසුම් කල යුතුවේ. |

## 4.5 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 ලිපිය සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජුලි 31 දැනැති බීඩී/සීබීපී/4/1/2 - 2018 දරන චක්‍රලේඛය පිළිබඳව අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් සිය විෂය පථයට අනුව ලබා කරගත යුතු තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගෙන නොතිබීම හේතුවෙන් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන් , මානව සම්පත් සහ භෞතික සම්පත් පිළිබඳ අවධානය යොමු කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී ලඟා කර ගැනීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | අරමුණු හා ඉලක්කයන් ලඟා කර ගැනීමට කටයුතු කල යුතු වේ. |